අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2019 අගෝස්තු මස 29**

## බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) විසින් 2019 අගෝස්තු 30 වන දින බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය සමරනු ලැබේ. ලොව පුරා දහස් ගණනක බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම්වලට ගොදුරුවූවන් සිහිපත් කිරීම වෙනුවෙන් 2011 වසරේ සිට මෙම දින වෙන් කොට තිබේ. පසුගිය වසරෙහි අගෝස්තු 30 වන දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුළ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය රාජ්‍ය මූලිකත්වයෙන් සමරන ලදී.

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට යටත්ව, අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ සොයා ගැනීම සහ එම තැනැත්තන් අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කිරීම වෙනුවෙන් පැහැදිලි බලයක් සහිත ව ස්ථාපිත කරන ලද ප්‍රථම ස්ථිර සහ ස්වාධීන රාජ්‍ය ආයතනය OMP වේ. අතුරුදහන් කරවන ලද වින්දිතයන්ගේ සහ පවුල්වල සාමාජිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන සහයෝගය ඇතිකිරීම සහ අනුස්මරණය හා පිළිගැනීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද මෙම කාර්යාලය සතුව බලය පවතී.

මෙම වසරේ සැමරුම් උත්සවය අතුරුදහන් කරවන ලද වින්දිතයන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් 'ශ්‍රාවස්ති මන්දිරය', අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 හි පිහිටි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පරිශ්‍රයේ දී ප.ව. 1.30 සිට ප.ව 3.30 දක්වා පැවැත්වීමට නියමිතය. එයට සමගාමීව, අතුරුදහන් කරවීම් හේතුවෙන් පවුල්වලට සිදුවන අඛණ්ඩ බලපෑම පිළිබඳ දැනුවත් කිරීම සඳහා "වේදනාව අතුරුදහන් නොවේ. ඔවුන් උදෙසා සත්‍යය සෙවීමේ වගකීම අපි ඉටු කරමු." යන තේමාව යටතේ සිදුකෙරෙන සන්නිවේදන වැඩසටහන ද ඉදිරියට ක්‍රියාත්මක කෙරේ.